// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2472/18 - 2026 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා - 2026.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DNK/LND1/DEACQ/12/20.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 03ජේ/88/ඊ/22.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංකොටුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක පු/දං/2000/198 හා 2001/03/14 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6750 ක් පමණ වන කොස්ගහවත්ත නැමති ඉඩම් කැබැල්ල.

01. කැබලි අංක **01**
ඉඩමේ නම: කොස්ගහවත්ත; හිමිකම් පාන්නා: හලාවත රදගුරු නිවසේ පදිංචි රාජගුරු ප්‍රසාදීන් වහන්සේ; ප්‍රමාණය: හෙක්. 0.6750.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 මාර්තු මස 11 වැනි දින පෙ. ව. 10.00 ට දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026 මාර්තු මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඩබ්ලිව්. නිලන්ති ප්‍රියදර්ශනී,**
ප්‍රාදේශීය ලේකම් (*රා.ආ.*)
දංකොටුව.

2026 ජනවාරි මස 16 වැනි දින,
දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0206

1A - G 046144 - 13 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*